## ජාතික පර්යේෂණ සභාව - 2012

1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පර්යේෂණ සභාව සඳහා පෙර කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ල වෙනුවෙන් කර ඇති රු.90,000 ක තැන්පතුව ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු දුරකථන, විදුලිය හා ජල ගාස්තු වෙනුවෙන් රු.24,143 ක් නිරවුල් කර නොතිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය. | 2011 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි. |
| (ආ) | 2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන ගැසට්පත්‍රය. | සාර්ථක පර්යේෂණ හා නවීකරණයන් සඳහා වාර්ෂික ජනාධිපති සම්මාන ප්‍රදානය 2007 වසරේ සිට පවත්වා නොතිබුණද, ඒ වෙනුවෙන් රු.971,944 ක් වැය කර තිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 154 | පර්යේෂණ සභාවේ නිලධාරීන්ට පෞද්ගලික වන සේ නිකුත් කර ඇති ලැප්ටොප් පරිගණක හා ජංගම දුරකථන සඳහා බෙදාහැරීමේ ලැයිස්තු වෙන් වෙන්ව තබාගෙන නොතිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 | ඉදිරි වර්ෂය සඳහා මිලදී ගැනීමට අපේක්ෂිත |

| | |
|---|---|
| දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) ඡේදය. | භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.21,470,618 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.18,148,802 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.3,321,816 ක පිරිහීමක් දක්නට ලැබුණි. මෙයට බලපෑ ප්‍රධාන හේතුව වූයේ මුළු ආදායම රුපියල් මිලියන 32 කින් වැඩිවීමට සාපේක්ෂව මුළු වියදම රුපියල් මිලියන 35 කින් වැඩිවීමය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 භෞතික කාර්යසාධනය

2010,2011 හා 2012 වර්ෂ වල භෞතික කාර්ය සාධනය පහත දැක්වේ.

| | **2012** | **2011** | **2010** |
|---|---|---|---|
| **පර්යේෂණ ප්‍රදාන** | | | |
| අයදුම්පත් ලැබීම | 152 | 199 | 74 |
| ප්‍රදාන ලබාදීම | 58 | 51 | 19 |
| දර්ශනපති/Mphil ශිෂ්‍යයින් | 67 | 67 | 06 |
| ජනාධිපති සම්මාන උළෙල පැවැත්වීම. | 2007, 2008, 2009, වර්ෂ සඳහා සම්මාන සඳහා පර්යේෂකයන් තේරීමේ කටයුතු නිම කිරීම. | 2007, 2008, 2009, වර්ෂ සඳහා සම්මාන සඳහා පර්යේෂකයන් තේරීමේ කටයුතු. | 2003,2004,2005,2006 විද්‍යාඥයින් 484 දෙනෙකුට සම්මාන ප්‍රදානය. |

3.1.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

2006 - 2012 දක්වා කාලපරිච්ඡේදය තුළ ජාතික පර්යේෂණ සභාව පර්යේෂණ 206 ක් සඳහා රු.702,000,000 ක මුදලක් ප්‍රදානය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රදානය කළ මුදල | ප්‍රදානය කළ පර්යේෂණ සංඛ්‍යාව | නිමකළ පර්යේෂණ සංඛ්‍යාව | අත්හැර දැමූ සංඛ්‍යාව | සාර්ථක ව්‍යාපෘති සංඛ්‍යාව | නිකුත් කළ ප්‍රකාශන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | රු. | | | | | |
| 2006 | - | 35 | 30 | 05 | 28 | 51 |
| 2007 | 150,000,000 | 14 | 10 | 04 | 08 | 09 |
| 2008 | - | 05 | 04 | - | 04 | 04 |
| 2009 | 72,000,000 | 24 | 09 | 02 | 03 | 08 |
| 2010 | 60,000,000 | 19 | 03 | 01 | 02 | 01 |
| 2011 | 200,000,000 | 51 | - | 03 | - | - |
| 2012 | 220,000,000 | 58 | - | - | - | - |
| | 702,000,000 | 206 | 56 | 15 | 45 | 73 |

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) 2006 සිට 2012 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කළ පර්යේෂණ ප්‍රදාන 206 කින් නිමකර තිබුණේ 56 ක් හෙවත් සියයට 27 ක් පමණි.

(ii) අත්හැර දැමූ පර්යේෂණ සංඛ්‍යාව 15 ක් වන අතර එය සියයට 7 කි.

(iii) නිමකළ පර්යේෂණ 56 කින් අවසන් වාර්තාව සමඟ ප්‍රකාශනයක් (publication) ඉදිරිපත් කර තිබුණේ පර්යේෂණ 45 ක් සඳහා පමණි.

(iv) නිමකළ පර්යේෂණ 56 ක් අතුරින් සාර්ථක පර්යේෂණ ලෙස හඳුනාගෙන තිබුණේ 45 ක් පමණි.

(v) පර්යේෂණවල අවසන් ප්‍රතිඵලය පර්යේෂණ ප්‍රකාශනයකට සීමාවීමත් පේටන්ට් අයිතිය ලබා ගැනීමට කටයුතු නොකිරීමත් නිසා පර්යේෂණ සඳහා ලබාදෙන මුදලට නිසි අගයක් නොලැබෙන බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

අ) 1999-2006 කාලපරිච්ඡේදය තුළ ප්‍රදානය කළ හා අවසන් කළ පර්යේෂණ ව්‍යාපෘති සඳහා මිලදී ගත් රු.127,354,214 ක් වූ ස්ථාවර වත්කම් හා උපකරණ එම ආයතනවලට පවරා දීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශවල පර්යේෂණ සභාවේ ස්ථාවර වත්කම් ලෙසම දක්වා තිබුණි. ඇතැම් වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්වී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ මෙම වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රමාණය රු.11,410,417 ක් විය.

ආ) පහත සඳහන් ව්‍යාපෘති නිමකළ යුතු කාලසීමාව අවසන්වී ඇති හෙයින් බැංකු ගිණුම් ද වසා තිබුණි. එසේවුවද, පර්යේෂණ නිමකර අවසන් වාර්තා 2013 මැයි වනතුරු ඉදිරිපත් කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

| ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය | ව්‍යාපෘතිය අවසන් කළයුතු දිනය | ව්‍යාපෘතින් ප්‍රදානයේ වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| 06-22 | 2008.04.01 | 2011.09.30 | 2,299,611 |
| 07-39 | 2009.04.30 | 2012.04.29 | 4,250,000 |
| 08-29 | 2009.12.01 | 2012.12.20 | 705,321 |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ). රු.32,859,458 ක් වූ පර්යේෂණ ප්‍රදාන ලබාගත් පර්යේෂකයන් 16 දෙනෙකු තම පර්යේෂණ ව්‍යාපෘති අතහැර දැමීම හේතුවෙන් ඒ සඳහා ලබාදුන් මුදල් වර්ෂ 1-4 ක කාලයක් බැංකු ජංගම ගිණුම්වල අක්‍රීයව පැවති අතරම, මෙම ව්‍යාපෘති අතහැර දැමූ පර්යේෂකයන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ආ). 1999/2000 වර්ෂවල ප්‍රදානය කරන ලද පර්යේෂණ ප්‍රදාන වලින් මිලදීගත් රු.20,890,325 ක පර්යේෂණ උපකරණ වෙනත් පර්යේෂණ ප්‍රදානවලට පවරා තිබුණද, ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ). පහත පර්යේෂණ ප්‍රදාන යටතේ මිලදී ගෙන ඇති උපකරණ දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

| ප්‍රදාන අංකය | උපකරණවල වටිනාකම | නිෂ්ක්‍රීයව පැවති ප්‍රමාණය | නිෂ්ක්‍රීයව පැවති කාලය | වෙනත් ව්‍යාපෘතියකට මාරු කිරීම |
|---|---|---|---|---|
| | රු. | රු | | රු |
| 05-19 | 1,199,700 | 362,750 | වසර 06 | 836,950 |
| 05-56 | 1,677,641 | 1,677,641 | වසර 06 | - |
| 05-18 | 439,800 | 85,008 | වසර 06 | - |

(ආ). සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ ව්‍යාපෘති 58 ක් සඳහා රු.215,615,052 ක මුදලක් ජංගම ගිණුම්වල තැන්පත් කර තිබූ අතර, 2012 දෙසැම්බර් 31 දින වනවිට පර්යේෂණ කටයුතු සඳහා යොදවා තිබුණේ රු.10,004,194 ක් පමණි. පර්යේෂණ ප්‍රදාන සඳහා මුදල් ලබාදීමේ වර්තමාන ක්‍රමය නිසා රජයේ අරමුදල් විවිධ බැංකු ගිණුම්වල දීර්ඝ කාලයක්

අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. පර්යේෂකයන් 04 දෙනෙකු සඳහා 2012 අප්‍රේල්, ජූලි මාසවල ලබාදුන් රු.16,818,386 ක් වටිනා පර්යේෂණ ප්‍රදාන 2012 දෙසැම්බර් 31 දින වනවිටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.5 හඳුනාගන්නා ලද පාඩු
-------------------------

පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා මිලදීගත් උපකරණයක් ක්‍රියාවිරහිතවීම නිසා 2009 වර්ෂයේදී අදාළ ආයතනයට බාරදී ඇතත්, එම ආයතනයෙන් අයවිය යුතු රු.150,869 ක් වර්ෂ 04 කට අධික කාලයක් තිස්සේ අයකර ගත නොහැකිව පවතී.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

4.1 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්
------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04 ක් පමණි. ජාතික පර්යේෂණ සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාජිකයින් 15 කින් සමන්විත වන අතර, රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ දායකත්වය ප්‍රමාණවත් නොවීය. සාමාජිකයින් පස් දෙනෙකු එකම රැස්වීමකටවත් සහභාගිවී නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ). සභාව විසින් පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති එක් එක් අරමුණු ඉටුකර ගැනීම සඳහා හඳුන්වාදී ඇති වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් පැහැදිලිව දක්වා නොතිබුණු අතර, ක්‍රියාකාරී සැලැස්ම කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා එක් එක් කාර්තුව සඳහා ළඟා කරගත යුතු භෞතික ඉලක්ක දක්වා නොතිබුණි.

(ආ). සභාවේ අයවැය ලේඛනය අනුව වාර්ෂික මුළු වියදම රු.මිලියන 253 ක් වුවත්, ක්‍රියාකාරී සැලැස්මේ මුළු වියදම රු.මිලියන 231 ට ඇස්තමේන්තු කර තිබුණි.

4.3 විගණන කමිටුව

-------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාර විධිමත් විගණන කමිටුවක් පත්කර නොතිබුණු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකුගේ සහභාගීත්වයෙන් සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් 01 ක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලනයන්.

-------------------------

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ). ගිණුම්කරණය.
(ආ). පර්යේෂණ ප්‍රදාන නියාමනය.
(ඇ). ස්ථාවර වත්කම් පාලනය.